# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/01/පොදු/Covid-19/2020 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2021.05.12 |

දකුණු පළාත් සභාවේ
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**<u>Covid – 19 තත්වය මත, රාජකාරී කටයුතු සඳහා සෞඛ්‍ය අංශ වෙත වාහන ලබා දීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2021.05.11 දින දකුණු පළාත් Covid – 19 මර්ධන කමිටු සාකච්ඡාව හා බැඳේ.

02. ඒ අනුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ ඉල්ලීම පරිදි පවතින Covid – 19 වසංගත තත්වය පාලනය කිරීම සඳහා කඩිනමින් කටයුතු කිරීමට සිදුව ඇති බැවින්, සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීමට ඇති අවශ්‍යතාවය ගරු ආණ්ඩුකාරතුමා විසින් දන්වා සිටින ලදී.

03. එබැවින් ඔබ අමාත්‍යාංශයේ හා යටත් දෙපාර්තමේන්තුවල/ ආයතනවල මෙම අවස්ථාවේ දී අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට අවශ්‍ය වන වාහන හැර අනෙකුත් සියළුම වාහන රියදුරු සමග පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලවල වෙත මුදා හැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

04. මේ සඳහා ඉහලම ප්‍රමුඛතාවය ලබා දී 2021.05.13 දින සිට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. මෙම හදිසි තත්වය තුළ ඔබ විසින් ලබා දෙනු ලබන සහයෝගය ඉතා අගයකොට සලකමි.

**ආර්. සී. ද සොයිසා,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:
1.ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත. : දැ. ගැ. ස.
2.සියළුම දිස්ත්‍රික් ලේකම්වරු - ගාල්ල, මාතර, හම්බන්තොට : දැ. ගැ. ස.
3.පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, දකුණු පළාත.
4.සියළුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු - ගාල්ල, මාතර, හම්බන්තොට
} අදාල කටයුතු සම්බන්ධීකරණය සඳහා

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"